## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - 2013

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම් වලදී ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී . ල.රා. අ.ගි.ප්‍ර)**

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ප්‍රමිත අංක 07 | දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරන්නේ නම් අදාල වත්කම අයත් කාණ්ඩයේ සියලුම දේපල,පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතුය. එසේ වුවත්,අධිකාරිය සතු සියලුම ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම හා ගොඩනැගිලි පමණක් 2008 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර රු.මිලියන1,378 ක් වූ ප්‍රත්‍යාගණන අගය මත මූල්‍ය ප්‍රකාශවල පෙන්නුම් කර තිබුණි. අනෙකුත් ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය නොකිරීම නිසා අධිකාරියේ ඉඩම් ගොඩනැගිලිවල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශවලින් පෙන්නුම් කර නොතිබුණි. |
| (ආ) ප්‍රමිත අංක 07 | මෙහෙයුම් කල්බදු යටතේ ලබා දී ඇති වත්කම්, ඒවායේ ස්වභාවය අනුව කල්බදු දෙන්නාගේ තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු වුවද මෙහෙයුම් කල්බදු යටතේ ලබා දී තිබුණු ඉඩම් හා තානායම්වල වටිනාකම අධිකාරියේ තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කර නොතිබුණි. |
| (ඇ) ප්‍රමිත අංක 08 | ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භකර ඇති පහත සඳහන් නෛතික සිද්ධි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.<br><br>(i) බාහිර ආයතන 03 ක් විසින් ජාත්‍යන්තර ඉන්දියානු සිනමා සම්මාන උත්සවය සඳහා ආහාර,නවාතැන් සහ ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් රු.32,980,555 ක් වන්දි ඉල්ලා ආයතනයට එරෙහිව අධිකරණ වල |

නඩු 03 ක් පවරා තිබීම.

(ii) සේවයෙන් ඉවත්කරන ලද සේවකයන් දෙදෙනෙක් සහ නවාතැන් බදු කරුවෙක් විසින් සහන ඉල්ලා අධිකරණවල නඩු තුනක් පවරා තිබීම.

(iii) ආයතනය විසින් බාහිර පුද්ගලයන් 13 දෙනෙකුට රජයේ දේපල අයුතු පරිහරණය සම්බන්ධයෙන් අධිකරණවල නඩු තුනක් පවරා තිබීම.

**2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්.**

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල සහ පහත සදහන් ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් අතර වෙනස්කම් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා පැහැදිලිකිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපයෝගී මූල්‍ය වාර්තාවල විස්තරය | උපයෝගී මූල්‍ය වාර්තා අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | රු. | | රු. | රු. |
| ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට ගෙවිය යුතු මුදල් | 26,848 | ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 58,115,407 | 58,088,559 |
| ශ්‍රී ලංකා හෝටල් හා කළමනාකරණ ආයතනයට ගෙවිය යුතු මුදල් | 6,511,960 | ශ්‍රී ලංකා හෝටල් හා කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 130,297,422 | 123,785,462 |
| ශ්‍රී ලංකා හෝටල් හා කළමනාකරණ ආයතනයට ලැබිය යුතු මුදල් | 11,290,282 | ශ්‍රී ලංකා හෝටල් හා කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 8,297,268 | 2,993,014 |

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.**

වෙළෙඳ ණය ගැතියන්ගෙන් ලැබිය යුතු රු.2,050,954 ක් වර්ෂ 4කට වැඩි කාලයක් ද, රු.79,451 ක් වර්ෂ 3කට වැඩි වර්ෂ 4කට අඩු කාලයක් ද, රු.4,621,863 ක් වර්ෂ 1 කට වැඩි පරාසයක් සහිත හිඟ ශේෂවලින් සමන්විත වී තිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| **විෂයය** | **වටිනාකම** (රු.) | **ඉදිරිපත් නොකල සාක්ෂි** |
|---|---|---|
| (අ) ක්ෂය ආයෝජන (සංචාරක මණ්ඩලය) | 52,154,737 | (i) සහතිකය හෝ වෙනත් ලිඛිත ලියවිල්ලක් |
| (ආ) ක්ෂය ආයෝජන (සංචාරක ප්‍රවර්ධන) | 976,509 | (ii) ශේෂය සනාථ කිරීමේ ලිපි |
| (ඇ) නිධන් අරමුදල් | 759,021 | (i) කොටස් සහතික හෝ වෙනත් ලිඛිත ලියවිල්ලක් |
| (ඈ) ශ්‍රී ලංකා සීමිත හෝටල් සංචාරක සමාගම | 750,000 | (ii) ශේෂය තහවුරු කිරීමේ ලිපි |
| (ඉ) සැපයුම් (විශාල ප්‍රමාණයේ කළුගල්) | 1,067,850 | (i) සැපයුම්කරු තෝරාගැනීමේ ලියකියවිලි<br>(ii) සැපයුම්කරු ඉදිරිපත් කරන ලද ඉන්වොයිස්පත්<br>(iii) ද්‍රව්‍යය ප්‍රවාහනයට යොදා ගත් වාහන විස්තර<br>(iv) සැපයුම් භාර ගැනීමේ සත්‍ය වාර්තා හා කල වැඩ වාර්තා |
| (ඊ) බෙන්තොට ජාතික නිවාඩු නිකේතන භූමියේ උතුරු මායිමේ බෙන්තොට ගඟට යාබද අක්කර 15 ක ඉඩම | - | සංචාරක මණ්ඩලයේ අනුප්‍රාප්තික ආයතනය වූ සංචාරක සංවර්ධන අධිකාරියේ අයිතියෙන් බැහැර වීමට අදාල ලිඛිත ලියවිලි |
| (උ) වෙළෙඳ ණයගැතියෝ | 20,641,412 | ශේෂ සනාථ කිරිමේ ලිපි |
| (ඌ) විවිධ ණයගැතියෝ | 4,638,137 | ශේෂ සනාථ කිරිමේ ලිපි |
| (එ) ජල පරිභෝජන ණයගැතියෝ (පාසිකුඩා) | 8,293,318 | ශේෂ සනාථ කිරිමේ ලිපි |

**2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත<br>(i) 1 පරිච්ඡේදයේ 12(4)(iii) වගන්තිය | පෞද්ගලික හෝටලයකට ලංකා බැංකුවෙන් නිකුත් කළ රු.මිලියන 100 ක ණය මුදලට අදාල පොළියෙන් රු.7,382,305 ක් අධිකාරිය විසින් දැරීමට අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 1 පරිච්ඡේදයේ 7(3) වගන්තිය | ඉහත ණය පොළිය අධිකාරිය විසින් දැරීමට 2010 ජූනි 6 දින අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණය බලාත්මක කිරීමට අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල සමාජික සංඛ්‍යාව 5 ක් වූ ගණ පූර්ණය නොතිබුණි. |
| (ආ) 1996 ජනවාරි 24 දිනැතිව ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ චක්‍රලේඛය | රජයේ ඉඩම් බදු දීමේදී බදු ගිවිසුම සහ බදු මුදල වර්ෂ 5 න් 5 ට සංශෝධනය කල යුතු වුවද අධිකාරිය විසින් බදු දී තිබුණු ඉඩම් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පී.ඊ.ඩී. 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| (i) 9 පරිච්ඡේදයේ 9.3.1(i) වගන්තිය | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය පාලක සභාව සහ අමාත්‍යාංශය විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව අනුමත කල යුතු වුවත්, "වන් ස්ටොප් යුනිට්" නම් වූ අංශයට බඳවා ගැනීම් මෙම නියමයන්ට අනුකූලව සිදු කර නොතිබුණි. |
| (ii) 9 පරිච්ඡේදයේ 9.14.1 වගන්තිය | මානව සම්පත් කළමනාකරණයට අදාල නීති හා රෙගුලාසි පිළිබඳ සියලු කරුණු ඇතුළත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පරිච්ඡේදයක් සහිත පටිපාටි සංග්‍රහය භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සහිතව පාලක මණ්ඩලය විසින් අනුමත කල යුතු වුවත්, අධිකාරිය එම අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.268,934,194 ක අතිරික්තයක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.190,161,685 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 78,772.509 ක වැඩිවීමක් විය. රු. 93,112,758 කින් සංචාරක සංවර්ධන හා අපගමන බදු සහ වෙනත් ආදායම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩි වීමට මූලික හේතුව වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ආදායම රු.මිලියන 496 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු.මිලියන 408 සමග සැසඳීමේදී සියයට 21.5 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ සංචාරක සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 217 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී ඒ සඳහා රු.මිලියන 227 ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 4.6 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1. කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) නිකේතනවල කාර්ය සාධනය**

අධිකාරියේ අයිතිය හා කළමනාකරණය යටතේ ක්‍රියාත්මක සංචාරක නිවාඩු නිකේතන 04 ක සහ සංචාරක නිකේතන 03 ක 2012 වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.13,605,316 ක් සමග සැසැදීමේදී සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.4,642,129 ක් විය. පොදු කාර්ය වියදම අධිකවීම හේතුකොට ගෙන නිවාඩු නිකේතන තුනක රු.15,667,048 ක ඌනතාවයක් ජනිත වීම අතිරික්තය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**(ආ) අධිකාරියට සමාලෝචිත වර්ෂය තුළදී හෝ මේ වනවිට ඉටු කරගැනීමට නොහැකි වූ අරමුණු හා පරමාර්ථ**

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 1 වන පරිච්ඡේදයට අනුව පහත සඳහන් අරමුණු හා කාර්යයන් ඉටු කරගෙන නොතිබුණි.

(i) දිගුකාලීන ඉලක්ක හා සිව් අවුරුදු සැලැස්ම පිළියෙල කිරීම හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සහ වාර්ෂික නව දිගුකාලීන ඉලක්ක ඇතුළත් කිරීමේ අරමුණින් ප්‍රතිශෝධනය කිරීම සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

(ii) පනතේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම,මේ තුලින් සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්තවලට අදාලව,දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිත වැඩි දියුණු කිරීම,බලාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා සංචාරක ව්‍යවසායකයන්ට බලපත් ලබා දීම හා බලය ලබා දීම.

(iii) පනතේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ පහසුකම් සැලසීම සඳහා සාමාන්‍ය හෝ වෙනත් මණ්ඩල පිහිටුවීම.

(iv) ශ්‍රී ලංකාවේ ඇති සංචාරකයන්ගේ සිත්ගත් ස්ථානවල චාරිකා කරන තැනැත්තන්ට ප්‍රවාහන පහසුකම් සැලසීමේ ව්‍යාපාර කරගෙන යාම.

(v) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ ix පරිච්ඡේදය අනුව සංචාරක ව්‍යවසායකයන් සහ සංචාරක සේවා ලියාපදිංචි කිරීම සහ සංචාරක සේවා සම්බන්ධයෙන් වූ මිල, ගාස්තු රේට ප්‍රමාණ සහ අයකිරීම් විධිමත් කිරීම.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**ඉඩම් හා දේපල කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ත්‍රිකුණාමලය කුච්චවේලි ප්‍රදේශයෙන් අධිකාරිය වෙත පවරාගන්නා ලද ඉඩම් අක්කර 510 කට ආසන්න බිම් ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සංවර්ධනය කර තිබුණේ ඉඩම් අක්කර 50කට අඩු ප්‍රමාණයකි.

(ආ) දේපලවල ඔප්පු පැවරුම්,එකතු කිරීම් හා සංවර්ධනය කිරීම් යනාදී විස්තර දක්වමින් ඉඩම් හා වත්කම් වෙනුවෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඇ) තානායම් 56 ක් හා අක්කර 6,495 ක වපසරියක් සහිත ඉඩම් කැබලි 166 ක් ආයතනයට පවරා ගැනීම සඳහා ගැසට් නිවේදන නිකුත් කර තිබුණද ,සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පවරාගෙන තිබුණේ කොටසක් පමණි.

(ඈ) බෙන්තොට ජාතික නිවාඩු නිකේතන ඉඩමේ වරාහේන ප්‍රදේශයේ ස්ථාන කිහිපයක මහා පරිමාණයෙන් වැලි ඉවත්කරගෙන තිබුණු අතර නිකේතන භූමියට කැලි කසල බැහැර කිරීම සහ අනවසර ඉදිකරීම්ද සිදුකර තිබුණි. මෙම සංචාරක භූමියේ සිදුවන මෙවැනි අනවසර ක්‍රියාවන් නැවැත්වීමට අධිකාරිය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.3 දෘශ්‍ය අක්‍රමිකතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කල්පිටිය,තොරයියඩි ජැටිය ඉදිකිරීම සහ වන්නිමුන්දලම කලපුව අසල පාර ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව

I. වෙළෙඳපල මිල කැඳවුම් ක්‍රමය යටතේ, කළුගල් සැපයීමට තෝරාගත් සැපයුම්කරු වෙනුවට ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි වෙනත් පුද්ගලයෙකුගෙන් කළුගල් කියුබ් 1648 ක් වැඩි මිලට මිලදී ගැනීම නිසා රු.824,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

II. කල්පිටිය වැඩබිමට කළුගල්,බොරළු සහ ඒ.බී.සී සැපයීම සඳහා යොදාගත් බවට සඳහන් ටිපර් රථයක ධාරිතාව කියුබ් 3 ක් වුවද කියුබ් 4 බැගින් ද්‍රව්‍යය සැපයූ ලෙස සලකා ගෙවීම් කිරීම නිසා වැඩිපුර ගෙවූ රු.2,549,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

III. කළුගල් කියුබ් 1648 ක් ඒ.බී.සී කියුබ් 368 ක් සහ බොරළු කියුබ් 40 ක් ලෙස භෞතිකව භාර නොගත් වටිනාකම රු.10,196,000 ක් ද්‍රව්‍ය සඳහා අධිකාරිය විසින් ගෙවීම්කර තිබිණි.

(ආ) බෙන්තොට නිවාඩු නිකේතන භූමියේ පල්දෝරු පද්ධතිය පවත්වාගෙන යාම සඳහා වූ ශ්‍රම කොන්ත්‍රාත්තුව වර්ෂ කිහිපයක සිට එකම ආයතනයකට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව පවරා තිබුණි.මෙම ශ්‍රම කොන්ත්‍රාත්තුව සඳහා අධිකාරිය විසින් 2012 සහ 2013 වර්ෂවල පිළිවෙලින් රු.4,458,023 ක් සහ රු.5,126,726 වශයෙන් එම ශ්‍රම කොන්ත්‍රාත් ආයතනයට මුදල් ගෙවා තිබුණ අතර එම ආයතනය විසින් උප කොන්ත්‍රාත්කරු වෙතට වර්ෂ දෙකටම එම කාර්යය කිරීමට රු.2,976,000 කට උප කොන්ත්‍රාත් දීමෙන් අධිකාරියට රු.6,608,749 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) කතරගම සංචාරක නිවාඩු නිකේතනයේ කාමර අංක 14 සිට 44 දක්වා සිදුකල අළුත්වැඩියා වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.29,195,802 ක මුදලින් රු.11,089,228 ක් වැඩිපුර ගෙවන ලද ප්‍රමාණයක් විය.

(ඈ) කල්පිටිය මොහොට්ටුවාරම ජැටිය ඉදිකිරීමේ කටයුතු සඳහා ඩෝසර් යන්ත්‍ර සැපයූ බවට සැපයුම්කරුවන් ඉදිරිපත් කල ලිපි තුනක් පදනම් කරගෙන ඔරලෝසු පැය 941.7 ක් සඳහා රු.3,226,950 ක මුදලක් ගෙවා තිබුණි. එහෙත් මෙම ඩෝසර් යන්ත්‍ර සේවය ලබාගත් බවට දිනපතා මනු කියවා වැඩපැය සටහන්කර එම වැඩපැය වාර්තා අධිකාරියේ නිලධාරියෙකුගෙන් සහතික කරගැනීමකින් තොරව මෙම ගෙවීම සිදුකර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති වැඩපරීක්ෂක විසින් ට්‍රැක්ටර් සේවාව සතුටුදායක ලෙස ලබා ගත් බවට උක්ත ලිපි තුනේ සහතික කර තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය, ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.5,934,000 කට මිලදීගෙන තිබුණු බස් රථය සඳහා පසුව රු.2,667,929 ක අළුත්වැඩියාවක් සිදු කර 2012 ජූනි මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ධාවනයට යොදා ගෙන නොතිබුණි.

(ආ) 1969 වර්ෂයේදී සංචාරක කර්මාන්තය සඳහා ලංකා සංචාරක මණ්ඩලයටද, පසුව සංචාරක සංවර්ධන අධිකාරියට පවරා දෙන ලද බෙන්තොට සංචාරක නිවාඩු නිකේතනයට අයත් අක්කර 94 ක පමණ භූමියෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම උපයෝජනය කර තිබුණේ අක්කර 50 ක පමණ භූමි ප්‍රමාණයකි. මේ අනුව වර්ෂ 43 කට වැඩි කාලයක් අක්කර 40 කට වැඩි භූමි ප්‍රමාණයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.5 ආර්ථික නොවන ගනුදෙණු

බිබිල,රාගල,හොරව්පතාන,මහියංගනය,වීරකැටිය,බත්තුළුඔය සහ නිකවැරටිය යන ප්‍රදේශවල නිවාඩු නිකේතන 7ක් සඳහා වර්ෂ 3කට පෙර සිට ආරක්ෂක කටයුතු සඳහා රු.3,508,415 ක් පමණ ගෙවා තිබුණි. එහෙත් මෙම නිකේතන ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බෙන්තොට ජාතික නිවාඩු නිකේතන ඉඩමේ වගාකර තිබෙන පොල් හා තැඹිලි ගස් 600 ක පමණ ප්‍රමාණයකින් 2013 වර්ෂයේ ජූලි මාසයේ සිට අඛන්ඩව මාස 6ක පමණ කාලයක් ඵලදාව නෙලා නොගැනීමෙන් රු.100,000කට වැඩි පාඩුවක් අධිකාරියට සිදු වී තිබුණි.

(ඇ) බෙන්තොට ජාතික නිවාඩු නිකේතන භූමියේ පිහිටි ව.අඩි 2880 ක පමණ ගොඩනැගිලි ඉඩකඩ ප්‍රමාණයක් 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ආර්ථිකමය කටයුත්තකට යොදා නොතිබුණි. මෙම ගොඩනැගිලි ඉඩකඩෙහි 2006 වර්ෂයේ මාසික ඉපයීම රු.20,000 ක් වූ අතර ඒ අනුව මුළු ඇස්තමේන්තු අලාභය රු.1,800,000 ක් වී තිබුණි.

(ඇ) කල්පිටිය ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය විදේශ අරමුදල් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 30 ඉක්ම වූ ව්‍යාපෘතියක් වශයෙන් වර්ගකර වැටුප් හා දීමනා වශයෙන් රු.3,780,253 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) අධිකාරිය සතු කොළඹ පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල (Dutch Hospital) නාගරික සංවර්ධන අධිකාරියට පැවරීමේදී පොත් අගයට වඩා රු.7,274,715 ක අඩු අගයට ලබා දී තිබුණි.

(ඊ) බෙන්තොට ජාතික නිවාඩු නිකේතන බල ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික ව්‍යාපාරික ආයතනයක් වෙත අධිකාරිය විසින් ජලය ලබාදෙන අතර 2005 වර්ෂයේ සිට ජලමනුව අක්‍රියව පැවති බැවින් එය නිවැරදි කර ගාස්තු අයනොකිරීම නිසා ඇස්තමේන්තුගත පාඩුව රු.8,415,400 ක් වී තිබුණි.

## 4.7 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාසිකුඩා සංචාරක නිකේතන ව්‍යාපෘතියේ වැසි වතුර බැස යාමේ කාණු පද්ධතිය ඉදි කිරීම.

I. ඉදිකිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන භූමියේ භූ විෂමතාව සැලකිල්ලට ගෙන ඉදිකිරීම් සිදු නොකිරීම හේතු කොටගෙන කාණු පද්ධතියේ ජලය රැදී පවතී.

II. අධිකාරියේ සැලසුම් හා සංවර්ධන අංශයේ අධ්‍යක්ෂවරයා මෙම ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කර ඇති අතර ඔහු

විසින් මෙම ව්‍යාපෘතියට අදාලව රු.31,394,813 ක ගෙවීම් වවුචරද සහතික කර තිබුණි. කොන්ත්‍රාත් පදනම මත සේවය කල නිකේතන නිලධාරී විසින් උක්ත ගෙවීම් වවුචර්වලට අදාල මිණුම් වාර්තා සහ ගෙවීම් බිල්පත් පරීක්ෂාකර සහතික කර ගෙවීම් වවුචරද පිළියෙල කර තිබුණද එය ඔහුගේ විෂය පථයට අඩංගු කරුණක් නොවුණි.

III. විගණනය විසින් ඉදිකිරීම් භෞතික පරීක්ෂා කිරීමේදී ගණනය කල තත්‍ය මිණුම් වාර්තා හා බිල්පත්වල සඳහන් ගෙවීම් ප්‍රමාණයන් සමග සැසඳීමේදී රු. 3,792,420 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ “වන් ස්ටොප්” ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වෙබ් අඩවිය නිර්මාණය කොන්ත්‍රාත්තුව,

I. වෙබ් අඩවිය නිර්මාණය කිරීමට පූර්ව සැලසුමක් හෝ ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණි.

II. තෝරාගත් සේවාදායකයා සමග ලිඛිත ගිවිසුමකට ඇතුළත් වීමකින් තොරව අදාල කාර්ය භාරය පමණක් ලිඛිතව දැනුම් දී තිබුණි.

III. කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් කාර්යසාධන ඇපකරයක් ලබාගෙන නොතිබුණි.

IV. 2014 ජනවාරි 6 දිනට මෙම කොන්ත්‍රාත්තුවට අදාලව රු.699,300 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**4.8 ව්‍යාපෘති ප්‍රමාදයන්**

---------------------

අතිරේක කාමර 4,000 ක් සහිත නිකේතන ඉදිකිරීම සහ යටිතල පහසුකම් ඇති කිරීම පිණිස රු.මිලියන 5,521 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ කර තිබුණු කල්පිටිය ඒකාබද්ධ සංචාරක ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කල්පිටිය ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වර්ෂ 5කින් නිම කිරීම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ මහා භාණ්ඩාගාරයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2008 වර්ෂයේදී ලබාගෙන තිබුණි. එසේ වුවත් 2013 දෙසැම්බර් 31 දින දක්වා එක් කාමරයක්වත් නිම කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සහ ව්‍යාපෘතියේ කළමනාකරණ වියදම් උපදේශන හා ප්‍රාග්ධන වැඩ යනාදිය ආවරණය වන පරිදි විස්තරාත්මක අයවැයක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය යටතේ දූපත් 12 ක් ආයෝජකයින් සඳහා ලබා දීමට අධිකාරිය යටතට බලය ලබා දි තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආයෝජකයින් වෙත ලබා දී තිබුණේ දූපත් 3ක් පමණි.

**4.9 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව තනතුරු 31 ක් යටතේ වර්ගීකරණය කර 192 ක සංඛ්‍යාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ තත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 156 ක් සහ 154 ක් විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2013 සිට 2015 වර්ෂය දක්වා වර්ෂ 3 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. මෙම සැලැස්මේ සඳහන් සමහර අයිතම සඳහා ඉලක්ක සඳහන් කර නොතිබුණ අතර එක් එක් වර්ෂය අවසානයේ ලඟා කරගත යුතු ඉලක්ක කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. එම ක්‍රියාකාරී සැලැස්මේ කාල නියමයන් සඳහන් කර නොතිබුණ අතර, ක්‍රියාකාරී සැලැස්මේ ඉටු කර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

සහකාර අධ්‍යක්ෂ තනතුර දරන නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් අභ්‍යන්තර විගණන අංශයක් පවත්වාගෙන යන අතර එම අංශයට ප්‍රමාණවත් සහකාර කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණි.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 8 හා 4.2.1(බී) අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙල කර නොතිබුණි.

### 5.5 අයවැය ලේඛණමය පාලනය

සමාලෝචිත වර්ෂයේදී විෂයයන් 13 ක අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 22 සිට සියයට 100 දක්වා පරාසයක වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

### 5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සභාගතකර තිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) සංවර්ධන වැඩසටහන්
(ආ) ව්‍යාපෘති කළමනාකරණය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
(ඉ) කොන්ත්‍රාත් පාලනය
(ඊ) ගිණුම්කරණය